# තේල්ස්ගේ සිට ප්‍රාග් සොක්‍රටීසියානු යුගය දක්වා ග්‍රීක දර්ශනිකයන්ගේ දේශපාලන ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක්

එම්. ඒ. සී. මුණසිංහ

## හැඳින්වීම

ග්‍රීසිය, යුරෝපයේ දකුණු දෙසින් මධ්‍යධරණී මුහුද අසබඩ පිහිටි ශ්‍රේෂ්ඨ සභ්‍යත්වයකට හිමිකම් කියන යුරෝපීය සභ්‍යත්වයේ කේන්ද්‍රස්ථානය වූ රාජ්‍යයයි. මධ්‍යධරණී මුහුද ගොඩබිමින් වට වූ විශාලතම මුහුද වන අතර එය යුරෝපය, ආසියාව, අප්‍රිකාව යන මහාද්වීප තුනෙන් මායිම් වී ඇත. ඉතාම වටිනා තොටුපලින් සමන්විත මධ්‍යධරණී මුහුද ඈත අතීතයේ පටන් මුහුදු ගමනාගමනය පැවති ස්ථානයක් බවට පත්ව තිබුණි. මධ්‍යධරණී මුහුදේ නැගෙනහිර කෙළවරේ බෝල්කන් අර්ධද්වීපය පිහිටි අතර ඊජියන් මුහුදින් (Aegean sea) එය සුළු ආසියාවෙන්[1] වෙන් කර තිබේ. බෝල්කන් අර්ධද්වීපයෙහි දකුණු තුඩුව සමන්විත වූයේ ග්‍රීසියට අයත් ප්‍රධාන ගොඩබිම සැකසුණු කුඩා අර්ධද්වීප සමූහයකිනි. ඊජියන් මුහුදේ කුඩා දිවයින් සමූහය එකිනෙකට නුදුරින් පිහිටියේය. එම නිසා මෙම දිවයින් අතර ගමනාගමනය පහසු විය. ග්‍රීක අර්ධද්වීපය හා ඒ අවට පිහිටි ප්‍රදේශ පුරාණ ග්‍රීසියට අයත් විය. කඳුකර ප්‍රදේශවලින් ගහණ වුව ද මුහුදු වෙරළ රට තුළට කා වැදී ඇති නිසා මුහුදු ගමනාගමනය රට අභ්‍යන්තර ගමනාගමනයට වඩා පහසු විය. මෙම භූගෝලීය පිහිටීම නිසා වෙරළබඩ කලාපයේ මුල් ම ජනාවාස පිහිටුවා ගත් ග්‍රීක වැසියා මුහුදු ගමනාගමනය හා ආක්‍රමණ නිසා බොහෝ යටත් රටවල භෞතික සම්පත් හා ඥානය සමීප කර ගත්තේ ය.

## ග්‍රීක දාර්ශනික චින්තනයේ ආරම්භය හා එහි ඇති දේශපාලන අදහස්

ග්‍රීක ඉතිහාසයේ විද්‍යාත්මක යුගය ඇරඹෙන්නේ ක්‍රි. පූ. 6 වන ශත වර්ෂයේ සිට ය. විද්‍යාව, දර්ශනය, ගණිතය, තර්කය ආදී සියල්ලෙහි නව යුගයක් උදාවන්නේ ක්‍රි. පූ. 6 වන සියවසෙන් පසුවය.[2] විශේෂයෙන් දාර්ශනික මෙන් ම විද්‍යාත්මක ක්ෂේත්‍රයෙහි පිබිදීමක් මෙකල ඇති විය. මෙම දාර්ශනික චින්තනයෙහි ලද වෙනස්වීම ග්‍රීක ඉතිහාසයෙහි දේශපාලනය සම්බන්ධයෙන් ද වැදගත් විය. ග්‍රීක දාර්ශනික ඉතිහාසයෙහි ආරම්භකයා ලෙස තේල්ස් හඳුන්වා දිය හැකිය. ඔහු සුළුආසියාවේ (තුර්කියේ) මිලේටස් පුරවැසියෙකි. මිලේටස් විශාල වහල් ජනතාවක් සිටි දියුණු නගරයකි. පොහොසත් නිදහස් ජනතාව සහ මෙම වහලුන් අතර නිරතුරු පංති සටනක් පැවතුණි. මෙම සටන පිළිබඳව History of the Ancient Worldකෘතියෙහි රොස්ටොව්ට්සේ මෙසේ සඳහන් කරයි.

---

1 සුළු ආසියාව නමින් හැඳින්වූයේ වර්තමානයේ තුර්කියට අයත් භූමියයි.සුළු ආසියාව ලෙස හැඳින් වූ භූගෝලීය කලාපය පිහිටියේ ග්‍රීසියට නැගෙනහිරින්, ආමේනියාවට බටහිරින්, සයිප්‍රසයට උතුරින්,කළු මුහුදට දකුණු දෙසිනි. Weech W. N., History of the world voll. 1, 1997, Omsons publications, New Delhi, p.102. ඇතුළත් සුළු ආසියාවේ (Asia Minor) සිතියම බලන්න.

2 Weber Alfred, History of Philosophy,1925, {Trans: Frank Thilly}, U.S.A, p.7.

''මුලදී මිලේටස්හි සාමාන්‍ය ජනතාව ජයග්‍රාහක වූවෝ පිළිමලුන් පණ පිටින් පුළුස්සමින් රදළයන්ගේ අඹුදරුවන් මරා දැමූහ. ඉක්බිති රදළයෝ ජය ලැබුවාහු පුරයේ එළිමහන් ස්ථානයන් මිනිස් පන්දම්වලින් ආලෝකමත් කළහ''.[3]

ඉතා දරුණු කෲර වධ හිංසාවන්ගෙන් ගහණ වූ දේශපාලන වටා පිටාවක් සුළු ආසියාවේ ග්‍රීක පුරයන් වැඩි සංඛ්‍යාවක මෙකල පැවතුණි. තේල්ස් උපන් මිලේටස් නගරය ක්‍රි. පූ. 6, 7 සියවස්වල ආර්ථික හා දේශපාලන විපර්යාසයන්ට භාජනය වූ නගරයකි. එහි දේශපාලන බලය පළමුව හිමි වූයේ ඉඩම් හිමි රදළ පංතියට ය. එය ක්‍රමයෙන් වෙළඳාමෙන් මුදල් ඉපයූ ධනවතුන්ගේ ආණ්ඩුවක් බවට පත්විය. අනතුරුව ප්‍රජා පීඩකයකු අතට මෙම බලය ලැබුණි. මොහු සාම්ප්‍රදායික ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක සහාය ඇතිව බලයට පත් වූවෙකි. ලිඩියානු රාජාණ්ඩුව සමග ද මිසරය සමග ද මිලේටස් පාලකයා මිත්‍ර සබඳතා පැවැත්වීය. මෙවන් දේශපාලන පසුබිමක් පැවැති ක්‍රි. පූ.6 වන ශතවර්ෂයේ තේල්ස් ''ටියෝස් අගනුවර හා පැඩරල් රාජ්‍යයක් වශයෙන් එක්සත් වන ලෙස අයෝනියානුවන්ට'' කීවේය. තේල්ස් විශ්ව සම්භවවාදියෙක් විය. ඔහු විශ්වය බිහිවූයේ කුමකින්ද? එහි ස්වභාවය කුමක්ද? එය ආපසු ගමන් කරන්නේ කුමක් වෙතද? යන ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමෙහි යෙදුනේය. ඔහු ජලය විශ්ව නිර්මාණයෙහි මූල ධාතුව වශයෙන් සැළකුවේය. මිනිසා ඇතුලු සියල්ල එක ම මූලධාතුවකින් බිහි වූ බව පවසන තේල්ස්ට අනුව ''විශ්වයෙහි පවතින සියලු දෑ අතර අන්තර් සම්බන්ධතාවක්'' පවතී.[4] දේශපාලන ක්‍රියාවලීන්ගේ අන්තර් සබඳතාවක් තේල්ස්ගේ මෙම අදහස්වලින් නිරූපණය වේ. පාලිත - පාලක දෙපක්ෂය අතරට ද මෙම මූලධර්මය සාධාරණ ය. විශ්වය හා එහි පාලනය දේව නිර්මාණයක් හෝ වෙනත් නොපෙනෙන බලයක් නොවන බව ප්‍රකාශ වීම වැදගත් වේ. විශ්වය භෞතික වූවක් බව ඉන් අර්ථවත් වෙයි. ඒ අනුව පාලනය පිළිබඳ දේව විශ්වාස හා සංකල්ප වෙනස් වීමට අවශ්‍ය පසුබිම සැකසීමට තේල්ස්ගේ විශ්ව නිර්මාණය පිළිබඳ ඉහත සඳහන් අදහස වැදගත් විය.

තේල්ස්ගෙන් පසුව වැදගත් වන ග්‍රීක දාර්ශනිකයා වන්නේ අනෙක්සිමැන්ඩර්ය (Anaximander). ක්‍රි. පූ. 611-547 අතර ජීවත් වූ ඔහු උපන්නේ සුලු ආසියාවේ (වර්තමාන තුර්කියේ) මයිලීටස් නුවරයි. ලෝකය පිළිබඳ තේල්ස්ට තිබූ ප්‍රශ්නය ම ඔහුට තිබුණ ද ඔහු ඊට පිළිතුරු දුන්නේ

''අපෙයිරොන් නමින් හැඳින්වෙන මූල ධාතුවකින් ලොව බිහිවීය'' [5]

යනුවෙනි. එහි අදහස සීමාවක් නොමැති යන්නයි. මේ අපරිමිතය කාලය, ගුණය, ප්‍රමාණය යන සීමා ඉක්මවා බිහි කිරීමේ හැකියාවෙන් යුක්ත වූවකි. ලෝකය ආපෝ, තේජෝ, වායෝ, පඨවි යන ධාතු කොටස්වලින් සැදුනු බව පැවසූ ඔහු ලෝක පාලක දෙවියකු ගැන විශ්වාස නොකළේය. අසාධාරණය, අයුක්තිය, වන්දි ගෙවීම, දඬුවම වැනි වචන ඔහුගේ මේ මූලධාතු හා සම්බන්ධ කර ඇතත් එහි හුදෙක් සාහිත්‍යමය වචනාර්ථයන් පමණක් ගැබ් වී ඇත. බටහිර දේශයනට ප්‍රථම වරට

---

3 Rosstovseaff, History of the Ancient World vol. 1, London, p.204.

4 පෙනෙන දෙය හා යතාර්ථය අතර වෙනසක් ඇති බවත් විශ්වය සෑදී ඇති මූල ධාතුව විවිධ ස්වරූපවලින් දැකිය හැකි වුවත් එය නැවත මූල ධාතුව හා එක් වන බවත් ඔහු ප්‍රකාශ කරයි.
කලංසූරිය ඒ. ඩී. පී., දර්ශනය ඃ හැඳින්වීමක්, 1987, ආරිය ප්‍රකාශකයෝ, වරකපොල, 20-21 පිටු.
උක්ත අදහසට අනුව ලොව විවිධ පාලන ක්‍රමයන් එක් මූලික න්‍යායකට සකස් කර ගැනීමේ අවස්ථාව හිමිවේ.

5 Cleve Felix M.,The Giants of Pre – Sophistic Greek Philosophy-An Attempt to Reconstruct Their Thoughts Voll. 1, 1973,Netherland, p.149.

පරිණාමවාදය හඳුන්වා දුන්නේ ඇනෙක්සිමැන්ඩර්ය. ඇනෙක්සිමැන්ඩර්ගේ පරිණාමවාදී චින්තනයදේශපාලනික වශයෙන් වැදගත් වන ආකාරය පහත පරිදි විග්‍රහ කළ හැකිය.

1. පාලනය සදතනික, නොවෙනස්වන මූලධර්ම හෝ ප්‍රතිපත්තිමත සැකසීම බුද්ධිගෝචර නොවන බව.
2. පාලකයින්, පාලන නීති-රීති, පාලන ක්‍රමවේද කාලීනව වෙනස් විය යුතු බව.
3. මෙම පරිණාමවාදී අදහස් දේශපාලන චින්තකයින්ගේ විෂයක්ෂේත්‍රයට පවා පසු කාලීනව එකතු වීම.
4. නූතනයේ දේශපාලන විද්‍යා විෂයේ වර්ධනයට දයක වීම. (වර්තමානයෙහි දේශපාලන විද්‍යාවේ දී උගන්වනු ලබන රාජ්‍ය ප්‍රභවය පිළිබඳ ඓතිහාසික විකාශනාත්මක වාදය නිදසුනක් ලෙස සඳහන් කළ හැකිය.)

එක් දෙයක් ඊට ප්‍රතිවිරුද්ධ දෙයක් කෙරෙහි බලපෑම අසාධාරණය යන ඇනෙක්සිමැන්ඩර්ගේ අදහස අනුව පාලක - පාලිත, පක්ෂ - විපක්ෂ වශයෙන් වන ප්‍රතිවිරුද්ධ දේ අන්‍යොන්‍ය වශයෙන් බලපෑම වැළැක්විය යුතුය. උදහරණ වශයෙන් වර්තමානයේ රාජ්‍ය පාලකයින්ගේ දේශපාලන තීරණ සමස්ත ජීවීන්ට හා ස්වභාවික පරිසරයට බලපෑම් කිරීම දැක්විය හැකිය. එමෙන් ම අවි නිෂ්පාදනය කරන්නන් හා අලෙවිකරුවන් දෙපිරිසකි. දේශපාලන අර්බුද නිර්මාණය කරන්නෝ වෙනත් පිරිසකි. මෙනිසා ඇති වන යුද්ධ - ගැටුම් හේතුවෙන් පීඩා විඳින්නන් බොහෝ විට ඊට කිසිදු සම්බන්ධයක් නැති වෙනත් පිරිසකි. මෙම තත්ත්වය වැළැක්විය යුතුය යන ආකල්පය වර්තමානයේ සමස්ත ලෝක දේශපාලන ක්ෂේත්‍රයේ ම අවධානයට ගැනීම වැදගත් වේ.

ක්‍රි. පූ. 588-524 අතර ජීවත් වූ අනෙක්සිමීනිස් (Aneximenes) තේල්ස් හා ඇනෙක්සිමැන්ඩර්ගේ ආභාසය ලැබ ලෝකයේ මූල ධාතුව ලෙස වාතය නම් කළ අතර එය සංකෝචන හා ප්‍රසාරණ ක්‍රියාදාමයන් එනම්, එකිනෙකට ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලියක් ගැන පැහැදිලි කළේය.[6] තව ද ඔහු විශ්වයේ වාතය හා අප හුස්ම අතර සමානත්වයක් තිබෙන බවත් වාතය අප ජීවත් කරවමින් පාලනය කරන බවත් විස්තර කළේය. ඔහුගේ එකිනෙකට ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලියට අනුව පාලනයට ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලිය නම් පාලනයෙන් තොරවීම,පාලනයෙන් බැහැර වීම, පාලනයට විරුද්ධ වීම හෝ පාලනය නොසළකා හැරීම ලෙස විග්‍රහ කළ හැකිය. අනෙක් වැදගත් කරුණ වන්නේ විශ්වයේ මිනිසා පාලනය කරණ මූල ධාතුව වාතය ලෙස සැළකීමෙන් ලෝක පාලක දෙවියන්ට වඩා ස්වභාව ධර්මයේ මූලයන් කෙරෙහි මූලිකත්වය දීමට මිනිස් චින්තනයයොමු කරවීමයි. මෙබඳු තත්ත්වයකදී ඇති වන සමාජීය බලපෑම සුවිශාලය. මෛලේසියානු ගුරුකුලයට අයත් මෙම මුල් ම දාර්ශනිකයන් තිදෙනා රාජ්‍ය පාලනයටඅදාළප්‍රබලදාර්ශනිකඅදහස් ඉදිරිපත්නොකළඅයලෙසසැළකියහැකිය. මෙම දාර්ශනිකයන් තිදෙනාවිද්‍යාත්මක ගවේෂණය සඳහාදරණ ලදප්‍රයත්නයන් නිසා වැදගත් වේ. පාලනය හා පාලකයන් පිළිබඳව ද විද්‍යාත්මකව තර්කානුකූලව සිතීමට පෙළඹීම මෙම චින්තකයින්ගේ විශ්ව සම්භවවාදී අදහස් ඉවහල් විය. මේ සඳහා ඔවුන්ට මිලේටස් නගරයේ පැවති සමාජආර්ථිකදේශපාලන වටපිටාව බලපෑවේය. මිලේටස් පොහොසත් වෙළඳ නගරයකි. බැබිලෝනියානු හා මිසර චින්තන මෙන් ම විවිධ ජාතීන් අතර ඇති

6 Weber Alfred, History of Philosophy, 1925, {Trans: Frank Thilly}, U.S.A, p.10.

වූ සම්බන්ධය නිසා මිලේටස්වාසීන්ටසාම්ප්‍රදායික අවිචාර විශ්වාසයන්ගෙන් මිදී සිතීමට අවස්ථාව උදාවිය. ක්‍රි. පූ. 494 දී මිලේටස් නගරය බිඳ වැටීමත් සමග මෛලේසියානු ගුරුකුලයට අයත් දාර්ශනික පරපුර අවසන් විය.[7]

සේමියානු ජාතිකයකු වන මනෙසාර්කොස්ගේ පුත්‍රයා වූ පෛතගොරස් (Pythagoras)සාමෝස්(Semos) නගරයේ වාසය කළේය. ඔහු ක්‍රි. පූ. 580-510 අතර ජීවත් විය. දර්ශනයෙන් ආගමික අදහස් ඉදිරිපත් කිරීමට උත්සාහ ගත් දාර්ශනිකයෙකි. මිනිසා හා විශ්වය පිළිබඳව අධ්‍යයනයක යෙදුනු ඔහු මිනිසාට සුව ගෙන දෙන ජීවන මාර්ගයක් පැවතිය යුතු බව කීවේය. මිනිසා හා විශ්වය අතර සබඳතාව තේරුම් ගැනීමට වෑයම් කළ ඔහු විශ්වයෙහි ප්‍රධානතම වස්තුව මිනිසා බව පැවසුවේය.[8] පෛතගොරස් සාමෝස් නගරය අතහැර වෙනත් ප්‍රදේශවලට ගොස් ජීවත් වූයේ එවකට සාමෝස් නගරයෙහි පාලකයා වූ අතිවිශාල ධන සම්භාරයක් රැස්කර සිටි, සුවිශාල නාවික හමුදාවක් සහිත, මැරවරයකු වූ පොලික්‍රටිස්ගේ හිතුවක්කාර කෲර පාලනයෙන් ගැලවීම පිණිස ය. පෛතගොරස් ගණිතඥයකු මෙන් ම දේශපාලනඥයෙකු ද විය. පොලික්‍රටිස්ගේ (Policratis) කෲර පාලනය කෙරෙහි ඇල්මක් නොදැක්වූ ඔහු ක්‍රි. පූ. 529 දී ඉතාලියට ගොස් ක්‍රි.පූ. 510 වනතුරු දකුණු ඉතාලියේ ක්‍රෝටෝන්හි ආගමික හා විද්‍යාත්මක මධ්‍යස්ථානයක් පිහිටුවා ගත්තේය. පෛතගොරස් එම නගරයේ බලයට පත් වී සිටි අතර එහි ජනතාව ඔහුගේ බලයට විරුද්ධව කැරළි ගැසුවේය. මේ නිසා මැටිපොන්ටියන් නම් ස්ථානයට ගොස් වාසය කර එහිදී ම මිය ගියේය.

පෛතගෝරියානු සමාජය දේශපාලන සමාජයකි. එහෙත් එය ආගමික ප්‍රභවයක් ඇති සහෝදර සංගමයකි. ඩෝරියානු රදළ පරමාදර්ශීන් සමග පෛතගොරස්ගේ දේශපාලන දර්ශනය කිසිඳු සබඳකමක් නැත. පෛතගෝරස්ගේ දර්ශනයට ජනතා විරෝධය කෙතරම් බලපෑවේද යත් පෛතගෝරස්වාදීන්ට පවා හිරිහැර විඳීමට සිදුවිය. ඔවුන්ගේ නිවාස ගිනිබත් කරවීය. මෙවන් තත්ත්වයක් පැවතිය ද පෛතගෝරස්ගේ අභාවයෙන් පසුව නැවත වරක් පෛතගෝරියානුවන්ට ඉතාලියේ බලයට පත්වීමට හැකිවිය. පෛතගෝරියානු අදහස් නූතන සමාජයට ද වැදගත් වේ. පෛතගොරියානු ඉගැන්වීම්වලට අනුව සමාජයේ ජීවත් වන පුද්ගලයින් ප්‍රධාන කාණ්ඩ තුනකට අයත් ය. එනම්,

1. ඥානය සොයන්නන් 11. නම්බුව සොයන්නන් 111. ලාභය සොයන්නන් වශයෙනි.

ඔලිම්පික් ක්‍රීඩා නැරඹීමට, ඒවායේ තරඟයට, එහි වෙළඳාමට එන්නන් මෙම කොටස් තුනට සමාන කර ඇත.

ක්‍රීඩා තරඟයකදී හුදු නිරීක්ෂකයන්ට වඩා ක්‍රීඩකයින් වැදගත්ය”[9] යන අදහසට අනුව

---

7 ගුණරත්න ඩයස්, ග්‍රීක දර්ශනය, 1963, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ, 20 පිටුව.

8 West M.L. Early Greek Philosophy and The Orient, 1971, Oxford, p.229.

9 ඔලිම්පික් ක්‍රීඩා පිටියට තුන් ආකාරයක මිනිස්සු පැමිණෙති.

i. ද්‍රව්‍ය මිලදී ගැනීමට හා විකිණීමට පැමිණෙන අය (පහත්ම අය)
ii. තරග කිරීම පිණිස එන ක්‍රීඩකයන් (උසස්ම අය)
iii. තරග නැරඹීමට පැමිණෙන්නන්

බර්න්ට් ජෝන්, ආදී ග්‍රීක දර්ශනය, 1964, (පරිඃ ඩී.පී.පොන්නම්පෙරුම), රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 96 පිටුව.

"දේශපාලන පොර පිටියෙහි තරඟකරුවන් වන දේශපාලනඥයන් නිකම් බලා සිටින්නවුන්ට වඩා උසස් ය"

යන්නෙන් පෛතගෝරියානු දර්ශනයේ දේශපාලනයට හිමි ස්ථානය කෙබඳු දැයි වටහා ගැනීම අපහසු නොවේ. පෛතගෝරියානු ඉගැන්වීම්හි දක්වෙන ඉහත අදහසට අනුව දේශපාලන ක්‍රියාකාරකම් ගෞරවාන්විත වූවකි. එහෙත් වර්තමාන සමාජයේ දේශපාලනයේ නියුක්ත වීම බොහෝ විට නම්බුව හා ලාභය ලැබීමේ පරමාර්ථයෙන් යුක්තය. ඥනය ලැබීමට දේශපාලන නිරීක්ෂකයින් වීම වර්තමානයෙහි ඉතා දුර්ලභ වන අතර දේශපාලනයෙහි දී පාලක - පාලිත දෙපක්ෂයේ ම අපේක්ෂාව වන්නේ ලාභය ලැබීම නම් එය පෛතගෝරියානු දේශපාලනික ඉගැන්වීම්වලට ප්‍රතිවිරුද්ධ වීමකි. තාපස ගුණයන් පුරුදු කිරීමට පෛතගෝරියානුවෝ දැඩි නීති - රීති අනුව ජීවිතය සකස් කර ගත්හ.[10] දේශපාලන කටයුතුවල නිරතවන්නන්ගේ චරිත සංවර්ධනය සඳහා නීති - රීති අවශ්‍ය වේ. මෙම අදහස තර්කානුකුල ප්‍රකාශයකට සැකසුවහොත්

1 පෛතගෝරියානු සමාජය දේශපාලන සමාජයකි.

2 පෛතගෝරියානුවෝ තාපස ගුණයන් පුරුදු කිරීමට දැඩි නීති - රීති අනුව ජීවිතය සකස් කර ගත්හ.

3 ඒ අනුව දේශපාලන සමාජයක තාපස ගුණයන් පුරුදු කිරීමට දැඩි නීති - රීති තිබිය යුතුය යනුවෙන් දක්විය හැකිය.

පෛතගෝරස් එක හා සමාන වූ කිසිවක් මෙලොව දෘෂ්‍යමාන නොවන බවත් පූර්ණ සමානත්වය පිළිබඳ අදහස් අප තුළ ඇති වන්නේ ඉන්ද්‍රියයන් අපට දක්වන ලොව නිසා නොව ඊට වඩා සත්‍ය වූ ලෝකයක් පිළිබඳ දැනීම නිසාය. ප්‍රකෘති ලෝකයෙහි සර්ව සම්පූර්ණ, පූර්ණ සමාජවාදී පාලන ක්‍රමයක් ගොඩ නැගීමේ දුෂ්කරතාව මෙමගින් කියැවේ. ඔහු සීමිතත්ත්වය (Condition ofLimited) පිළිබඳ අදහසක් ද ඉදිරිපත් කරයි. මෙම සීමිතත්ත්වය තුළින් සාධාරණත්වය සොයා ගැනීම අසීමිත දෙයට සීමිතත්ත්වය ගැන්වීමෙන් ලැබෙන බව විස්තර කරයි. මේ සඳහා ගණිත සිද්ධාන්ත භාවිත කරයි. සංගීත භාණ්ඩයක වෙනස් වෙනස් ස්වර ඇති කිරීමට හැකි වන්නේ එම සංගීත භාණ්ඩයේ කම්බිය නොයෙකුත් ගණිතමය රාශිවලට බෙදීමෙනි. ඒ ස්වර පිළිබඳ වෙනස රඳා පවතින්නේ යම්කිසි කාල සීමාවක දී නිකුත් වන තරංග සංඛ්‍යාව මතය. සංගීතයෙහි උස් - පහත් ස්වර ගෙන දෙන රාගීන් අතර මධ්‍ය සොයා ගැනීමෙන් සාධාරණත්වය ලබා ගත හැකිය. වෛද්‍යවරයකු ශරීරයේ උණුසුම් හා සිසිල්බවේ මධ්‍ය සොයා ගැනීමෙන් ප්‍රතිකාර සාර්ථක කර ගනී. මෙම අදහස දේශපාලනයට ද පොදු ය. බලය, නම්බුව, ලාභය යන කවර තත්ත්වයක දී වුව ද ඉහළ හෝ පහළ රාශියකට යාමෙන් දේශපාලන සාධාරණත්වය ඉටු නොවේ. එමෙන් ම අසීමිත දෙයට සීමිතත්ත්වය ගැන්වීමෙන් සාධාරණත්වය ලබා ගත හැකි ය. අඳුර නැමැති අසීමිත දෙයට ආලෝකය නැමැති සීමිතත්වය එක්වීමෙන් (සීමාවීමෙන්) ආලෝකය ඇති වේ. එමෙන් ම පාලන විරහිතත්ත්වය නම් වූ අසීමිතත්ත්වයට, පාලනය නම් වූ සීමිතත්ත්වය එක්වීමෙන් යහපත් පාලනයක් ඇතිවේ. පෛතගෝරස් සෑම දෙයක් ම අංකයනට සමාන කළ අතර මේවා ජ්‍යාමිතික හැඩතල අනුව

[10] ගුණරත්න ඩයස්, ග්‍රීක දර්ශනය, 1963, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ, 24 පිටුව.

නිර්මාණය කළේය. මෙම අංක ගණිත හා ජ්‍යාමිතික හැඩතල පාලන තන්ත්‍රයේ ඒ ඒ පාලන තනතුරු හා රාජ්‍ය ආරක්ෂක කඳවුරු ස්ථානගත කිරීමට ඍජුව සම්බන්ධ කර ගනී.

ක්‍රි. පූ. 535-475 අතර විසූ හෙරක්ලීටස් (Heraclitus) විශ්වයේ උපත හා එහි ස්වරූපය පිළිබඳ අදහස් ප්‍රකාශ කළ දාර්ශනිකයෙකි. හෙරක්ලීටස් පිළිබඳ රචනා වූ දාර්ශනික කෘතිවලට අනුව ඔහු ප්‍රජාතන්ත්‍රවාදයට ප්‍රතිවිරුද්ධ මත දැරූවෙක් බව සනාථ වේ. යුද්ධයේ වැදගත්කම පිළිගත් හෙතෙම යුද්ධය සියල්ලන්ගේ ම පියා ලෙස සැලකුවේය. යුද්ධය සියල්ලන්ගේ රජය. යුද්ධය සියල්ලන්ට ම පොදු බවත් කලහය (විරෝධය) වූ කලි යුක්තිය බවත් සියලු දේ ම ඇති වී නැති වන්නේ කලහය නිසා බවත් ඔහු පැවසුවේය. විරුද්ධ වූ දේ තුළ ම එකඟත්වය ඇති වන ආකාරය ඔහු ඉන් පෙන්වා දුනි. හෙරක්ලීටස්ගේ කාලයේ රාජ්‍ය පාලකයා වූයේ දාරෙයියොස් රජු ය. බැසිලෙවුස්හි පුරාණ රජ කුලයකට අයත් වූ හෙරක්ලීටස් දාරෙයියොස් සමඟ සමීප සබඳතා පැවැත්වීය. එෆීසියානුවරු දාරෙයියොස් රජුට කප්පම් ගෙවමින් සිටියදී ම හර්මෝදෝරොස් නම් එෆීසියානුවා රටින් පිටුවහල් කරනු ලැබීම නිසා පර්සියානු පාලනයට විරුද්ධ ව්‍යාපාරයක් ගොඩ නැගුනේ ද මේ කාලයේදී ය.[11] හෙරක්ලීටස්ගේ ඉගැන්වීම් විශ්වය, දේශපාලනය හා දේවධර්මය පිළිබඳ වූ ඒවා විය. ඔහු දේශපාලනය ගැන ඉගැන්වුව ද සිය සොහොයුරා වෙනුවෙන් තමා දැරූ නාමික නායකත්වයෙන් පවා ඉල්ලා අස්වීමට ක්‍රියාකර ඇත. හෙරක්ලීටස් යුද්ධය අනුමත කළ දර්ශනිකයෙකු වුව ද යුද්ධය නිසා වන සමාජ, ආර්ථික, සංස්කෘතික, මානසික තත්ත්වයන්ගේ ස්වරූපය හෝ විනාශය පිළිබඳ අවධානය යොමු නොකිරීම නිසා ඔහුගේ දර්ශනය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීමේ දී දුෂ්කරතා ඇතිවේ.

ක්‍රි. පූ. 495 - 435 අතර සිසිලි දූපතේ අක්‍රගාස් පුරවැසියෙක් වූ එම්පිඩොක්ලීස් (Empedocles) ඩෝරියානු රාජ්‍යය නිජ බිම කරගත් එකම දාර්ශනිකයා විය. ඔහු ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලකයෙකි. වෛද්‍යවරයෙකි. එනිසා ඔහු විසින් ම ඔහු දෙවියකු ලෙස හැඳින්වීය. සිසිලියේ ප්‍රජාපීඩකයින් හා ප්‍රජාතන්ත්‍රවාදීන් අතර ඇති වූ ගැටුමින් ප්‍රජාපීඩකයන් ජයගත් අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් අග්‍රකාස් නගරයෙන් එම්පිඩොක්ලීස් පිටුවහල් කරනු ලැබීය. මෙසේ රටින් පිටුවහල් කරනු ලැබූ බොහෝ දෙනෙක් මෙන් එම්පිඩොක්ලීස් ග්‍රීසියේ සතුරන් වූ පර්සියාව හා කාර්තේජ් සමඟ සබඳතා ඇති කර නොගත්තේය. එබඳු කුමන්ත්‍රණකාරී සරණාගතයෙකුගේ ජීවිතයෙන් මිදුණු එම්පිඩොක්ලීස් තෞරියොයි නගරයේ වාසය කරමින් මුණිවරයකුගේ ජීවිතයට සමාන ජීවිතයක් ගත කළේය.[12] ඔහුගේ සමකාලිකයන්ගේ මී මුණුපුරන් ඔහු ගැන මැවූ චිත්‍රවලින් පවා පිළිබිඹු වන්නේ ඔහුගේ ප්‍රජාතන්ත්‍රවාදී හැඟීම්වල ස්ථිරසාර භාවයයි. ඔහු ප්‍රතික්ෂේප කළ රජ පදවියක් පිළිබඳ ව හා ඔහු පිළිගත් ''දහස් දෙනාගේ මන්ත්‍රණ සභාවක්'' පිළිබඳ ව ඓතිහාසික ග්‍රන්ථවල සඳහන් වේ. ඔහුගේ දර්ශනය දේශපාලන පොර පිටියෙහි සටන් කරමින් කුමන්ත්‍රණ, පාවාදීම් සිදු කරමින්, තමන්ගේ බලය සඳහා අන්‍යයන්ගේ ජීවිත බිලි ගනිමින්, බලයට පැමිණීමට රට, ජාතිය පාවා දෙමින් ක්‍රියා කරන දේශපාලනඥයින්ට එසේ නොකිරීමට ආදර්ශයක් සපයන්නේ ය.

ක්‍රි. පූ 460 උපන් ඇනෙක්සගෝරස් (Anexagoras)අයෝනියාවේ උපන්නෙකි. ඔහු ඇතැන්ස් නගරයේ වාසය කළ අතර පෙරික්ලස් නම් රාජ්‍ය නායකයා සමඟ සමීප සබඳතා පැවැත්වූවෙකි.

---

[11] බර්න්ට් ජෝන්, ආදි ග්‍රීක දර්ශනය, 1964, (පරිඃ ඩී.පී. පොන්නම්පෙරුම), රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 127 පිටුව.

[12] රසල් බට්රන්ඩ්, බටහිර දර්ශන ඉතිහාසය, 1970, පරිවර්තනය හා මුද්‍රණය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 67 පිටුව.

පෙරික්ලස්ගේ බලය හීනවන විට ලොව සෑම තැනක ම පාහේ සිදු වූ ''පවත්නා සංස්කෘතියට වඩා හොඳ සංස්කෘතියක්" පැවසීමේ වරදට දඬුවම් නියම වූ ඇනෙක්සගෝරස් ඇතැන්ස් පුරයෙන් පිටුවහල් වූයේ සිරගෙයින් මිදී පලායාමට පෙරික්ලිස්ගේ සහාය ලැබුණු නිසාය. සොක්‍රටීස්ගේ හා ප්ලේටෝගේ දර්ශනයන්ට මූලික පදනම සකස් කිරීමේ ගෞරවය මොහුට හිමිවේ.[13]

පරමාණුවාදීන් ලෙස හැඳින්වෙන ඩිමෝක්‍රීටස්, සීනෝ ලෙවුකීපස්, ආදී දාර්ශනිකයින්ගේ අදහස් ඉදිරිපත් කිරීමට බාධාකාරී නොවූ දේශපාලන පසුබිමක් ග්‍රීසියේ පැවතුණි. විශේෂයෙන් ප්‍රෝටගොරස් නම් විතණ්ඩවාදියා ඉදිරිපත් කළ ''එදිනෙදා ජීවිතයේ දී වැදගත් වන කරුණු'' මුදලට ඉගැන්වීම නිසා පංති හැඟීමක් තරුණ පිරිස අතර ඇති විය. ග්‍රීසියේ ඇතැන්ස්හි මෙන් ම අනෙක් නගරවල ද දේශපාලනික වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය ජයගත් අතර පැරණි රදළයින් ස්වකීය ධන සම්පත් ආරක්ෂා කර ගැනීමට උත්සාය දැරීය. එහෙත් ධනවතුන් හා දිළින්දන් අතර චින්තනමය ගැටුමක් පැවතුණි. නව චින්තනය මෙහෙය වූවෝ ධනවතුන් ය. ඔවුහු දේශපාලන ප්‍රතිගාමීන් ලෙස හැඳින්වූහ. මොවුහු නීතිඥ වැනි තර්කය අවශ්‍ය වෘත්තීන් සඳහා විශේෂඥ දැනුමින් යුක්ත වූහ. ඔවුහු මුදල් ලබා ගනිමින් තරුණ පිරිසට අවශ්‍ය දැනුම ලබා දෙමින් සිටියහ.[14] මෙම පිරිස දේශපාලනය පිළිබඳ නව ආකල්ප ඇති කිරීමට සමත් වූහ. දේශපාලනය සමාජයේ කැපී පෙනෙන, ලාභ ලැබිය හැකි තනතුරකි යන ආකල්පය ඇති කරණු ලැබුවේ මොවුහුය. මෙනිසා පාලනය හා සම්බන්ධ සදචාර ධර්ම සම්පූර්ණයෙන් ම පාහේ විනාශ වී ගියේය.

## නිගමනය

ග්‍රීක දාර්ශනික දේශපාලන චින්තනයේ ආරම්භය ප්ලේටෝ නැමති දාර්ශනිකයාගේ සිට යැයි සඳහන් වුව ද ග්‍රීක දාර්ශනිකයන් අතර දේශපාලනය පිළිබඳ අදහස් දක්නට ලැබෙන්නේ මුල්කාලීන දාර්ශනිකයින්ගේ දාර්ශනික චින්තන සමග වීම සුවිශේෂී ලක්ෂණයකි. එය සොක්‍රටීස් දක්වා වූ දාර්ශනිකයින්ගේ දාර්ශනික චින්තනයන්හි අන්තර්ගත කරුණු විමසීමේ දී පැහැදිළි වන්නකි. ඍජු ව ම දේශපාලනයට සම්බන්ධ අදහස් මෙන් ම වක්‍රාකාර ව දේශපාලනයට සම්බන්ධ අදහස් ද එම දාර්ශනික චින්තනවල දක්නට ලැබේ.

---

13 Vergilius Ferm with 41 eminent Authorities, History of Philosophical Systems, 1961, Littlefield Adams & Co., Paterson,U.S.A., p.78.

14 Kirk G.S. & Raven J.E., The Presocratic Philosopers ; A Critical History with Selection Of Texts, 1975,Cambridge University press, p.18.